අධ්‍යාපන අමාත්‍යාංශය/கல்வி அமைச்சு/Ministry of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப்)
General Certificate of Education (Ord. Level)

| 34 | S | 1 |
|---|---|---|

විද්‍යාව I
விஞ்ஞானம் I
Science 1

පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2018
பரீட்சை முன்னோடி வினாப்பத்திரம் - 2018
Pre-Practice Question paper - 2018

පැය එකයි.
ஒரு மணித்தியாலம்
One hour

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, පිළිතුරු සඳහා (1), (2), (3), (4) ලෙස වරණ හතර බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ** පිළිතුරට අදාළ වරණය තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ඔබ තෝරාගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.

1. උෂ්ණත්වය මැනීමේ අන්තර් ජාතික සම්මත ඒකකය වන්නේ,
   (1) θ ය. (2) T ය. (3) $^{o}$C ය. (4) K ය.

2. පහත සඳහන් ඒවා අතරින් ඒකක රහිත භෞතික රාශිය වන්නේ,
   (1) ද්‍රව්‍ය ප්‍රමාණය යි. (2) මවුලික ස්කන්ධයයි.
   (3) සාපේක්ෂ පරමාණුක ස්කන්ධයයි. (4) සාන්ද්‍රණය යි.

3. සුළඟ මගින් සහ ජලය මගින් ව්‍යාප්ත වීමට අනුවර්තනය දරන බීජ අනුපිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) ඕලු, එඬරු (2) වරා, පොල් (3) හොර, රබර් (4) හොර, එඬරු

4. ඉච්ඡානුග පේශි සංකෝචනය පාලනය කරනු ලබන්නේ,
   (1) මස්තිෂ්කය මගිනි. (2) අනුමස්තිෂ්කය මගිනි. (3) සුෂුම්නා ශීර්ෂකය මගිනි (4) සුෂුම්නාව මගිනි.

5. හයිඩ්‍රා, මුහුදු මල වැනි සතුන් අයත්වන සත්ත්ව වංශය වන්නේ කුමක් ද?
   (1) නිඩාරියා. (2) ඇනලිඩා. (3) ආත්‍රපෝඩා. (4) එකයිනොඩර්මේටා.

6. යකඩ නිස්සාරණයේ දී ධාරා උෂ්මකය තුළ හීමටයිට් ඔක්සිහරණය කරන්නේ කිනම් ඔක්සිහාරක වායුව මගින් ද?
   (1) කාබන් ඩයොක්සයිඩ් (2) කාබන් මොනොක්සයිඩ් (3) ඔක්සිජන් (4) ජල වාෂ්ප

7. ස්කන්ධය 500 g වන වස්තුවක් 60 cm $s^{-1}$ ප්‍රවේගයකින් චලිත වේ. වස්තුවේ ගම්‍යතාව කොපමණ ද?
   (1) 30 000 kg m $s^{-1}$ (2) 300 kg m $s^{-1}$ (3) 30 kg m $s^{-1}$ (4) 0.3 kg m $s^{-1}$

8. ජලයේ වාෂ්පීකරණයේ විශිෂ්ට ගුප්ත තාපය 2 260 kJ $kg^{-1}$ වේ. උෂ්ණත්වය 100 $^{o}$C හි ඇති ජලය 10 g ක් 100 $^{o}$C හුමාලය බවට පත් කිරීමට අවශ්‍ය තාප ප්‍රමාණය කොපමණ ද?
   (1) 22 600 J (2) 2 260 J (3) 226 J (4) 22.6 J

9. විදුලි පංකාවකට 12 V විදුලි සැපයුමක් සම්බන්ධ කළ විට ඒ තුළින් ගලන ධාරාව 2 A වේ. විදුලි පංකාවේ ක්ෂමතාව කොපමණ ද?
   (1) 6 W (2) 12 W (3) 24 W (4) 48 W

10. එක්තරා ද්‍රව-ද්‍රව මිශ්‍රණයක සංයුතිය 12% *V/V* ලෙස සඳහන් විය. එහි 50 $cm^3$ ක අඩංගු ද්‍රාවක පරිමාව වන්නේ,
    (1) 6 $cm^3$ කි. (2) 12 $cm^3$ කි. (3) 44 $cm^3$ කි. (4) 88 $cm^3$ කි.

11. මිනිස් සිරුරේ බරින් 7% ක් ඛනිජ ලවණ වේ. මේ අතරින් කැල්සියම් හා පොස්පරස් ප්‍රධාන වේ. සිරුරේ කැල්සියම් ඛණිජ ඌනතාව හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ,
    (1) පේශි දුර්වලවීම ය. (2) දත් හා අස්ථි දුර්වලවීම ය. (3) ස්නායු දුබලතා ඇතිවීම ය. (4) රක්තහීනතාව ය.

12. $L_1$ හා $L_2$ යනු නාභිය දුර පිළිවෙළින් 25 cm හා 20 cm වන අභිසාරී සහ අපසාරී කාච දෙකකි. $L_1$ කාචයේ සිට 25 cm ක් දුරින් එහි ප්‍රධාන අක්ෂය මත O නම් ලක්ෂ්‍යාකාර වස්තුවක් තබා ඇත. කාච දෙකෙහි වර්තනයෙන් පසු අවසන් ප්‍රතිබිම්බය පිහිටන්නේ,




(1) උත්තල කාචයට වම් පැත්තේ අනන්තයේ ය.
(2) උත්තල කාචයට දකුණු පැත්තේ, උත්තල කාචයේ සිට 25 cm දුරින් ය.
(3) අවතල කාචයට වම් පැත්තේ අවතල කාචයේ සිට 20 cm දුරින් ය.
(4) අවතල කාචයට දකුණු පැත්තේ අනන්තයේ ය.

13. පහත දැක්වෙන ඒවායින් අන්වායාම තරංගයක් වන්නේ කුමක් ද?
(1) ජල පෘෂ්ඨයක හට ගන්නා ජල තරංග.
(2) වයලීනයක සිට කන දක්වා වාතය ඔස්සේ පැමිණෙන තරංග.
(3) කම්පනය වන ගිටාර කම්බියක හටගන්නා තරංග.
(4) ගිනි මැලයක සිට ඒ අසල සිටින්නෙක් දක්වා පැමිණෙන තාප තරංග.

14. හෘද ස්පන්දනයේදී ඇතිවන **ලබ්- ඩප්** ශබ්ද පිළිබඳ ප්‍රකාශ හතරක් දී ඇත.

A. **"ලබ්"** ශබ්දය ඇතිවන්නේ ද්විතුණ්ඩ හා ත්‍රිතුණ්ඩ කපාට වැසීමේ දී ය.
B. **"ලබ්"** ශබ්දය ඇතිවන්නේ අඩසඳ කපාට වැසීමේ දී ය.
C. **"ඩප් "**ශබ්දය ඇතිවන්නේ ද්විතුණ්ඩ හා ත්‍රිතුණ්ඩ කපාට වැසීමේ දී ය.
D. **"ඩප් "**ශබ්දය ඇතිවන්නේ අඩසඳ කපාට වැසීමේ දී ය.
මේවායින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද ?
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D

15. ජලීය ද්‍රාවණයේ දී භාගිකව අයනීකරණය වෙමින් $H^+$ අයන මුදාහරින සංයෝගය,
(1) $HNO_3$ ය. (2) $H_2CO_3$ ය. (3) $H_2SO_4$ ය. (4) NaOH ය.

16. ශාකවල සිදුවන බහිස්‍රාවී ක්‍රියාවලියක් ලෙස සැලකිය හැක්කේ,
(1) උත්ස්වේදනය මගින් ජල වාෂ්ප පිට කිරීමයි.
(2) බින්දුදය මගින් ඛණිජ ලවණ පිට කිරීමයි.
(3) ප්‍රභාසංස්ලේෂණයේදී ඔක්සිජන් වායුව පිට කිරීමයි.
(4) බින්දුදය මගින් ජල බින්දු පිට කිරීමයි.

17. **Na , Mg , Al , S** හා **P**
යන මූලද්‍රව්‍ය අතරින් උභයගුණී ඔක්සයිඩ සාදන්නේ කුමන මූල ද්‍රව්‍යය ද?
(1) Na ය. (2) Mg ය. (3) S ය. (4) Al ය.

18. ආවේණිය සම්බන්ධ වගන්ති කිහිපයක් පහත දැක්වේ.
A. ප්‍රතිවිරුද්ධ ලක්ෂණ යුගලකින් එක් ලක්ෂණයක් පමණක් ප්‍රවේණිගත වන ආකාරය සොයා බැලීම ඒකාංග මුහුමයි.
B. ආවේණික ලක්ෂණ යනු පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන ලක්ෂණ වේ.
**C.** ආවේණික ලක්ෂණ පරම්පරා කිහිපයක් මගහැර ඊළඟ පරම්පරාවකට සම්ප්‍රේෂණය විය **නොහැකි ය.**
මේවායින් සත්‍ය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C ය.

19. X නම් වූ ලෝහය තනුක අම්ල සමඟ ප්‍රතික්‍රියා කර හයිඩ්‍රජන් වායුව පිට කරයි. එය පිහිටිය හැක්කේ සක්‍රියතා ශ්‍රේණියේ පහත සඳහන් කිනම් ස්ථානයක ද?
(1) Ag සහ Au අතර (2) Pb සහ Cu අතර (3) Cu සහ Hg අතර (4) Al සහ Fe අතර

20. සෝඩියම් (Na) පරමාණුවේ ප්‍රෝටෝන 11 ක්, නියුට්‍රෝන 12 ක් සහ ඉලෙක්ට්‍රෝන 11 ක් පවතී. මෙම පරමාණුව සම්මත ක්‍රමයට ලියා දක්වන්නේ කෙසේ ද?

(1) $^{12}_{11}Na$ (2) $^{11}_{12}Na$ (3) $^{23}_{11}Na$ (4) $^{23}_{12}Na$

21. තාප සැපයුමක් මගින් ඝන ද්‍රව්‍යයක් ක්‍රමයෙන් රත් කරන ලදී. කාලයත් සමග එම ද්‍රව්‍යයේ උෂ්ණත්වය විචලනය වූ ආකාරය ප්‍රස්තාරයෙන් දැක්වේ. මෙම ද්‍රව්‍යයේ හිමාංකය දළ වශයෙන් කොපමණ ද?




(1) - 50 $^0$C (2) 25 $^0$C (3) 150 $^0$C (4) 250 $^0$C

22. පහත සඳහන් ප්‍රකාශ අතරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මල බැඳීම සඳහා ජලය හා ඔක්සිජන් අත්‍යාවශ්‍ය සාධක වේ.
(2) අම්ල හා ලවණ මල බැඳීමේ ශීඝ්‍රතාව වැඩි කරන සාධක වේ.
(3) හස්ම මල බැඳීමේ ශීඝ්‍රතාව අඩු කරයි.
(4) කැතෝඩීය ආරක්ෂණයෙන් මල බැඳීම වැළකේ.

23. රූපයේ දැක්වෙන්නේ සෛල විභාජන අවස්ථාවකට අදාළව වර්ණදේහ සංඛ්‍යා බෙදී යන ආකාරයයි. මෙම සෛල විභාජන ක්‍රමයේ ඇති වැදගත්කමක් **නොවන්නේ,**




(1) බහු සෛලික ජීවීන්ගේ දේහ වර්ධනයට ඇතිවන බලපෑම යි.
(2) අලිංගික ප්‍රජනන ක්‍රමයක් ලෙස සැළකිය හැකිවීමයි.
(3) මැරුණු සෛල වෙනුවට නව සෛල ලබා දීමයි.
(4) පරම්පරාවෙන් පරම්පරාවට වර්ණදේහ සංඛ්‍යාව නියතව පවත්වා ගත හැකිවීමයි.

24. රූපයේ දැක්වෙන්නේ පාපැදියක චලිතය නිරූපණය කෙරෙන විස්ථාපන - කාල ප්‍රස්තාරයකි. ඒ අනුව පාපැදියේ ප්‍රවේගය කොපමණ ද?




(1) 0.4 m s$^{-1}$ (2) 2.5 m s$^{-1}$ (3) 5 m s$^{-1}$ (4) 20 m s$^{-1}$

25. පහත සඳහන් ඒවායින් ප්‍රසාරණයේ යෙදීම් වන්නේ මොනවා ද?
A - කරත්ත රෝදයකට යකඩ පට්ටමක් සවි කිරීම. B - රේල් පීලි දෙකක් අතර හිදැසක් තැබීම.
C - ද්වි ලෝහ පටියක් විදුලි ඉස්තිරික්කයකට සවි කිරීම. D - දුරකථන හා විදුලි රැහැන් බුරුල්ව සවි කිරීම.

(1) C පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි. (2) A,B, C, D සියල්ලම ය.

26. මිශ්‍රණවල සංඝටක වෙන් කිරීමේ පහත සඳහන් ක්‍රමවලින් යාන්ත්‍රික ක්‍රමයට අයත් වන්නේ,
(1) ගැරීම ය. (2) හැලීම ය. (3) ජලයේ පා කිරීම ය. (4) ඉහත සඳහන් සියල්ලම ය.

27. ජලය සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A. ඉතා හොඳ ද්‍රාවකයකි.
B. දේහ උෂ්ණත්වය යාමනයේ දී වැදගත් වේ.
C. දේහය තුළ ද්‍රව්‍ය පරිවහන මාධ්‍යය ලෙස ක්‍රියාකරයි.
D. එන්සයිමවල මනා ක්‍රියාකාරිත්වයට වැදගත් වේ.

මේ අතරින් ජලය සතු සුවිශේෂී ගුණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) A, B, C (2) B, C, D (3) A, B, D (4) A, C, D

28. රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි ඒකක කාලයක දී ප්‍රතික්‍රියක අංශු අතර ඇතිවන ගැටුම් සංඛ්‍යාවයි. මීට අදාළ පහත දැක්වෙන ප්‍රකාශ සළකා බලන්න.
A. ප්‍රතික්‍රියකවල සාන්ද්‍රණය වැඩි වූ විට එම අංශු අතර ගැටුම් සංඛ්‍යාව වැඩි වේ.
B. මාධ්‍යයේ උෂ්ණත්වය අඩු වූ විට ප්‍රතික්‍රියක අංශු අතර ගැටුම් සංඛ්‍යාව අඩු වේ.
C. ප්‍රතික්‍රියකවල පෘෂ්ඨ වර්ගඵලය වැඩි වූ විට ඒවායේ අංශු අතර ගැටුම් සංඛ්‍යාව අඩු වේ.
මෙම ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) A , B හා C යන සියල්ලම ය.

29. ට්‍රාන්සිස්ටරයක සංකේතයක් පහත දැක්වේ. ට්‍රාන්සිස්ටර් වර්ගය සහ එහි අග්‍ර නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

| වරණ අංකය | ට්‍රාන්සිස්ටර් වර්ගය | පාදම | විමෝචකය | සංග්‍රාහකය |
|---|---|---|---|---|
| (1) | n p n | 2 | 1 | 3 |
| (2) | n p n | 1 | 2 | 3 |
| (3) | p n p | 2 | 1 | 3 |
| (4) | p n p | 3 | 1 | 2 |



30. සෝඩියම් කාබනේට් ($Na_2CO_3$) , 53 g ක අඩංගු කාබන් පරමාණු සංඛ්‍යාව කොපමණ ද ?
(Na = 23 , C = 12 , O = 16 )

(1) $\frac{6.022 \times 10^{23} \times 53}{106}$  (2) $\frac{6.022 \times 10^{23} \times 106}{53}$  (3) $\frac{106 \times 53}{6.022 \times 10^{23}}$  (4) $\frac{53 \times 53}{6.022 \times 10^{23}}$

31. ආලෝක කිරණ පරාවර්තනය සහ වර්තනය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
A. පාරදෘශ්‍ය මාධ්‍ය දෙකක් වෙන් කරන පෘෂ්ඨයකට ආනතව පතනය වන සියලු කිරණ වර්තනය වේ.
B. ඝනතර මාධ්‍යයක සිට විරල මාධ්‍යයක් දෙසට ගමන් කරන ආලෝක කිරණ පරාවර්තනය වීම පූර්ණ අභ්‍යන්තර පරාවර්තනය නම් වේ.
C. ආලෝකයේ වර්තන නියමවලට **ස්නෙල් නියම** යයි කියනු ලැබේ.
ඉහත ප්‍රකාශවලින්
(1) B පමණක් සත්‍ය වේ.  (2) A හා B පමණක් සත්‍ය වේ.
(3) A, B හා C යන සියල්ල ම සත්‍ය වේ.  (4) A, B හා C යන සියල්ල ම **අසත්‍ය** වේ.

32. රූපයේ දැක්වෙන පරිපථයේ A, B, C හා D යනු සර්වසම බල්බ හතරකි.
පරිපථයේ S ස්විච්ය සංවෘත කළ විට,




(1) A බල්බය නිවී යන අතර B හා C හි දීප්තිය වැඩි වේ.
(2) C බල්බය නිවී යන අතර B හා A හි දීප්තිය අඩු වේ.
(3) A හා C බල්බ නිවී යන අතර D හි දීප්තිය වැඩි වේ.
(4) A හා C බල්බ නිවී යන අතර B හි දීප්තිය වැඩි වේ.

33. ශ්‍රී ලංකාවේ රෝග නිසා සිදුවන මරණවලින් 60% ක් පමණ සිදුවන්නේ බෝ නොවන රෝග හේතුවෙනි. බෝ නොවන රෝග ඇතිවීමට ප්‍රධාන හේතුවක් වන්නේ,
(1) අපිරිසිදු ජලය පානය කිරීමයි.
(2) වැරදි ආහාර පරිභෝජන රටා ය.
(3) වායුගෝලයේ හරිතාගාර වායු ප්‍රතිශතය ඉහළ යාමයි.
(4) කාබනික පොහොර **නොයෙදූ** ආහාර අනුභව කිරීමයි.

34. රූපයේ දැක්වෙන ප්‍රතිරෝධක පද්ධතියේ A හා B හරහා සමක ප්‍රතිරෝධය කොපමණ ද?




(1) 5 Ω  (2) 7 Ω  (3) 9 Ω  (4) 11 Ω

35. AB හා DC නම් සැහැල්ලු සන්නායක තන්තු දෙකක් මගින් BC දණ්ඩ තිරස්ව එල්ලා ඇත. කඩදාසියේ තලයට ලම්බකව කඩදාසිය තුළට චුම්බක ක්ෂේත්‍රයක් ක්‍රියා කරයි. තන්තුවල A හා D දෙකෙළවර හරහා විද්‍යුත් පරිපථ සම්බන්ධ කර ඇත. a, b හා c රූප මගින් දක්වා ඇති පහත අවස්ථා තුන සලකන්න.




a - රූපය  b - රූපය  c - රූපය

a, b හා c අවස්ථාවලදී තන්තුවල ආතති අතර පවතින නිවැරදි සම්බන්ධතාව කුමක් ද?
(1) $T_1 > T_2 > T_3$  (2) $T_1 > T_3 > T_2$  (3) $T_1 = T_2 > T_3$  (4) $T_2 > T_3 > T_1$

36. විද්‍යුත් රසායනය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – ඉලෙක්ට්‍රෝන පිටකිරීම ඔක්සිකරණයයි.
B – ඔක්සිකරණය සිදුවන ඉලෙක්ට්‍රෝඩය කැතෝඩයයි.
C – බාහිර පරිපථය හරහා ඇනෝඩයේ සිට කැතෝඩය දක්වා ඉලෙක්ට්‍රෝන ගලා යයි.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ ,
(1) A හා B පමණි.  (2) B හා C පමණි.  (3) A හා C පමණි.  (4) A , B, C සියල්ලම ය.

37. බොහෝ ශ්වසන ආබාධ ඇතිවීම කෙරෙහි දුම්පානය හේතු වේ. දුම්පානය සම්බන්ධ පහත ප්‍රකාශ සළකා බලන්න.

1 **ප්‍රකාශය**- දුම්පානය කරන පුද්ගලයින්ගේ රුධිරය මගින් පරිවහනය කරන ඔක්සිජන් ප්‍රමාණය අඩු වේ.

2 **ප්‍රකාශය**- පෙනහලුවල දී සිගරට් දුමෙහි අඩංගු කාබන් මොනොක්සයිඩ් රුධිරයට උරාගෙන හිමොග්ලොබින් සමඟ බැඳේ.

පහත පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 1 හා 2 ප්‍රකාශ දෙක ම **සත්‍ය** වේ.
(2) 1 හා 2 ප්‍රකාශ දෙක ම **අසත්‍ය** වේ.
(3) 1 ප්‍රකාශය **සත්‍ය** වන අතර 2 ප්‍රකාශය **අසත්‍ය** වේ.
(4) 1 ප්‍රකාශය **අසත්‍ය** වන අතර 2 ප්‍රකාශය **සත්‍ය** වේ.

38. පහත දැක්වෙන්නේ සෛලීය ශ්වසනයේ ආකාර දෙකට අදාළ රසායනික සමීකරණ වේ.

(a) ග්ලූකෝස් + ඔක්සිජන් ⟶ කාබන්ඩයොක්සයිඩ් + ජලය + ශක්තිය
(b) ග්ලූකෝස් ⟶ ලැක්ටික් අම්ලය + ශක්තිය

මෙම අවස්ථා දෙකට අදාළව නිවැරදි පිළිතුර තෝරන්න.

(1) (a) අවස්ථාව සවායු ශ්වසනය වන අතර ග්ලූකෝස් අණු අර්ධ වශයෙන් බිඳ හෙලයි.
(2) (a) අවස්ථාව නිර්වායු ශ්වසනය වන අතර ග්ලූකෝස් අණු පූර්ණ වශයෙන් බිඳ හෙලයි.
(3) (b) අවස්ථාව නිර්වායු ශ්වසනය වන අතර ග්ලූකෝස් අණු අර්ධ වශයෙන් බිඳ හෙලයි.
(4) (b) අවස්ථාව නිර්වායු ශ්වසනය වන අතර ග්ලූකෝස් අණු පූර්ණ වශයෙන් බිඳ හෙලයි.

39. පහත දැක්වෙන්නේ පේශි පටක වර්ග තුනෙහි දළ සටහන් වේ. a, b හා c පටකවලට අදාළ නිවැරදි ප්‍රකාශ සඳහන් පිළිතුර තෝරන්න.


a රූපය


b රූපය


c රූපය

| | a | b | c |
|---|---|---|---|
| (1) | ආහාර මාර්ග බිත්තිවල පිහිටා ඇත. | ද්විශීර්ෂ පේශිවල පිහිටා ඇත. | හෘදයේ පිහිටා ඇත . |
| (2) | තර්කුරූපී හැඩැති ය. | සිලින්ඩරාකාර හැඩැති ය. ශාඛනය වී ඇත. | ශාඛනය වී ඇත. |
| (3) | ඉච්ඡානුග ය. | ඉච්ඡානුග ය. | අනිච්ඡානුග ය. |
| (4) | ඒක න්‍යෂ්ටික ය. න්‍යෂ්ටිය සෛලය මධ්‍යයේ පිහිටයි. | ඒක න්‍යෂ්ටික ය. න්‍යෂ්ටිය සෛලය පර්යන්තයේ පිහිටයි. | ඒක න්‍යෂ්ටික ය. සෛලයේ න්‍යෂ්ටිය පිහිටීම අක්‍රමවත් ය. |

40. පරිසර දූෂණයේ අහිතකර බලපෑම් කිහිපයක් මෙහි දැක්වේ.

a) ගෝලීය උණුසුම ඉහළ යාම
b) ශාකවල ඵලදායීතාව අඩුවීම
c) අම්ල වැසි ඇතිවීම
d) ආක්‍රමණික ජීවී විශේෂ ඇතිවීම

මේවායින් පරිසර දූෂණයේ ඍජු බලපෑම් හා වක්‍ර බලපෑම් ලෙස වෙන් කළ හැකි කරුණු අඩංගු පිළිතුර තෝරන්න.

| | ඍජු බලපෑම් | වක්‍ර බලපෑම් |
|---|---|---|
| (1) | a , b | c , d |
| (2) | a , c | b , d |
| (3) | b, c | a , d |
| (4) | a , d | b , c |

***

# 1 - පත්‍රයේ පිළිතුරු

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 2 | 21 | 2 | 31 | 4 |
| 2 | 3 | 12 | 3 | 22 | 1 | 32 | 4 |
| 3 | 2 | 13 | 2 | 23 | 4 | 33 | 2 |
| 4 | 1 | 14 | 3 | 24 | 2 | 34 | 1 |
| 5 | 1 | 15 | 2 | 25 | 3 | 35 | 4 |
| 6 | 2 | 16 | 3 | 26 | 4 | 36 | 3 |
| 7 | 4 | 17 | 3 | 27 | 1 | 37 | 1 |
| 8 | 1 | 18 | 1 | 28 | 1 | 38 | 3 |
| 9 | 3 | 19 | 4 | 29 | 3 | 39 | 1 |
| 10 | 3 | 20 | 3 | 30 | 1 | 40 | 2 |